www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# වෝල් වීදියේ ලොකුම බැංකු තුනක් වසර අවසානයේ ප්‍රසාද දීමනා වශයෙන් ඩොලර් බිලියන 49.5 ක් ගෙවීමට නියමිතයි

**Three top Wall Street banks to award $49.5 billion in year-end bonuses**

**බැරී ග්‍රේ විසිනි**

**2010 ජනවාරි 05**

තව ටික දිනකදී ඇමරිකාවේ ප්‍රධාන බැංකු හා මූල්‍යායතන විසින් 2009 වසර අවසානයේ ගෙවීමට නියමිත දැවැන්ත ප්‍රසාද දීමනා සම්බන්ධයෙන්, එක්සත් ජනපද මාධ්‍ය මුලුමනින්ම නිහඬව සිටියි. එය, වැඩකරන ජනතාව අවපාත මට්ටමේ විරැකියාවටත්, ඉහල නගින නිවාස වෙන්දේසිකිරීමටත් සාගින්න හා දුප්පත්කමටත් ඇද දමා තිබෙන තත්වය තුල, බදු ගෙවන්නන්ගේ වියදමෙන් ඇප ලබාගෙන තිබෙන වෝල් වීදියේ විධායකයන් විසින් අත්කරගෙන තිබෙන මූල්‍ය වාසි පිලිබඳව මහජන කෝපය දැල්වෙද්දී, ව්‍යාපාරිකයන්ගේ ග්‍රහනයේ පවතින මාධ්‍ය මේ තත්වය කෙරෙහි, සිතාමතාම දක්වන ප්‍රතිචාරයක් බව නිසැකය. ජනවාරි 1 දින *නිව් යෝර්ක් ටයිම්ස්* පත්‍රයේ ව්‍යාපාරික අංශයේ ඇතුලත පිටුවල "බැංකු හොඳපිට පෙරලීමත් සමග විශාල ප්‍රසාද දීමනා" යන හිසින් පලකොට තිබූ කෙටි ලිපියක යාන්තමින් සඳහන් වූයේ වෝල් වීදියේ ලොකුම බැංකු තුන ගනන් බලා ඇති පරිදි මුදලින් ද කොටස් පරිත්‍යාග වශයෙන් ද ඩොලර් බිලියන 49.5 ක් ප්‍රසාදදීමනා ලෙස ගෙවීමට කටයුතු කරමින් සිටින බවයි.

ගෝල්ඩ්මන් සැක්ස්, මොර්ගන් ස්ටැන්ලි හා ජේපී මෝර්ගන් චේස් යන මෙම බැංකු 2008 ඔක්තෝබරයේ දී කොන්ග්‍රසය විසින් සම්මත කල කරදරයට පත් වත්කම් සඳහා සහන සැලසීමේ බිලියන 700 ක් වූ ටාර්ප් යන වැඩ සටහන යටතේ, ඒකාබද්ධව බිලියන 45 ක් ලබාගත්හ. අනෙකුත් බැංකු ද සමග එක්ව ඔවුන්, ශුන්‍යයට ආසන්න පොලියකට නය ද නය සහතික ද සුරැකුම් මිලට ගැනීම් හා අනෙකුත් සහන වශයෙන් භාන්ඩාගාරය හා මහ බැංකුව වෙතින් ඩොලර් ට්‍රිලියන ගනනක් සපයා ගත්තේය.

තව දුරටත් ආන්ඩුව, 2008 මූල්‍ය බිඳවැටීම කුලුගැන්වූ සමපේක්ෂනාත්මක භාවිතයන්ට ඉඩ සැලසීම සඳහා කිසිදු සීමාවක් නොපනවන අතර වාරයේ, ශුන්‍යයට ආසන්න පොලී අනුපාතිකයක් පවත්වා ගනිමින් ද ඩොලර් ට්‍රිලියන ගනනක පහසු නය ද මූල්‍ය වෙලඳපොලවලට පොම්ප කරමින්, බැංකු ලාභ හා පැටව් ගසන ප්‍රසාද දීමනා ප්‍රතිරක්ෂනය කලේය.

මේ අතර ඇමරිකානු මහජනතාවට, ප්‍රධානකොටම නිවාස අගය කඩාවැටීම තුලින්, ට්‍රිලියන 11 ක ධන සම්භාරයක් අහිමිවී ගියේය. තමන්ගේ පැත්තෙන් බැංකු, ආර්ථිකය වෙතින් ට්‍රිලියන 3 ක නය මුදල් වාෂ්පවී යාමට ඉඩ හරිමින්, පසුගිය මාස 15 තිස්සේ ම නයදීම් තියුනු ලෙස කපාහැර තිබුනි.

2008 වසර ඉකුත් වෙද්දී බුෂ් පරිපාලනය, එවකට ජනාධිපති අපේක්ෂක බරක් ඔබාමා හා කොන්ග්‍රසයේ ඩිමොක්‍රටිකයන්ගේ සහාය ද ඇතිව ඇපදීමේ සැලැස්ම ජනතාවට අලෙවි කිරීමට උත්සාහ කලේ, එමගින් බැංකු වලට යලිත් නය දීම ආරම්භ කිරීමට ඉඩ සැලසෙන්නේය යන පදනම මතය. කෙසේ වෙතත්, ඇප දුන් බැංකු මත ටාර්ප් රෙගුලාසි කිසිවක් නො පැනවීම මගින්, තමන්ට හිමිවූ මුදල් වාසනාව කෙසේ වැය කරන්නේ ද යන්න ආන්ඩුවට ප්‍රකාශ කිරීම පවා අවශ්‍ය නොවන පරිදි, එම මුදලින් තමන් කැමති දෙයක් කිරීමට බැංකු වලට ඉඩ සලසනු ලැබිනි.

බැංකු විසින් නය හිරකිරීමේ ක්‍රියාවලිය, ආර්ථික පසුබෑම ගැඹුරු වීමේදීත් දිග් ගැස්සීමේදීත් ප්‍රධාන භූමිකාවක් ඉටුකර තිබේ. ව්‍යාපාරවලට හා පාරිභෝගිකයන්ට නය පහසුකම් පුලුල් කිරීම වෙනුවට බැංකු ක්‍රියාකලේ, කොටස්, බැඳුම්කර, මූල්‍ය හා භාන්ඩ වෙලඳමේ සමපේක්ෂන කටයුතු තුලින් සමහර විට වාර්තාගත, දැවැන්ත ලාභ උපයා ගැනීමටය.

ටයිම්ස් හි එම ලිපිය තුලම, නිව් යෝර්ක් හි ගිනුම් හා බදු විශ්ලේෂකයෙක් වන රොබට් විලේන්ස්,

පූර්වාරක්ෂිත අරමුදල් ක්ෂේත්‍රය සැලකිල්ලට නොගෙන ඉදිරිපත් කල සංඛ්‍යාවක් වන, එක්සත් ජනපද බැංකු විසින් බිලියන 200 ක් ප්‍රතිලාභ ලෙස ගෙවනු ඇති බවට කල ගනන් බැලීමක් ගෙනහැර දැක්වීය.

මෙම ප්‍රමානය ඉදිරිදර්ශනයක් තුල පිහිටුවුව හොත් එය, දල වශයෙන් ඇමරිකානු කම්කරුවන් මිලියන හතරකගේ මධ්‍යස්ථ වාර්ෂික වැටුපට සමාන වන්නේය.

ටාප් මුදල් දිගටම ලග තබාගෙන සිටින බැංකුවල විධායකයින්ගේ වැටුප් මත පනවා ඇති අල්ප සීමාවන්ගෙන් මිදීමට හැකිවන පරිදි සියලු ම ප්‍රධාන බැංකුවලට එන්නත් කල ටාප් මුදල් ආපසු ගෙවීමට ඔබාමා පරිපාලනය විසින් ඉඩ සලසාදී තිබේ.

විලේන්ස්ට අනුව, බිලියන 200 වන්දි ගෙවීමේදී, පවත්නා බදු නීතිය යටතේ බොහෝ සේවකයන්ගේ වන්දි බදුවලින් නිදහස් කල හැකි වියදමක් ලෙස සලකන බැවින්, බැංකුවලට බදු නොගෙවා බිලියන 80 ඉතිරි කර ගත හැකිය. සිය සේවකයින්ට බිලියන 23 ක වාර්තාගත බෝනස් මුදලක් පිරිනැමීමට බලාපොරොත්තු වන ගෝල්ඩ්මන් සැක්ස් ලොකුම බදු වාසිය හිමිකරගනු ඇත. ගෝල්ඩ්මන් 2009 වසර සඳහා ගෙවන ප්‍රසාද මුදල් මත ෆෙඩරල් ආන්ඩුවේ ආදායම් බදු වලින් නිදහස් වීම මත බිලියන 9 ක් පමන ඉතිරිකර ගනු ඇත. ගෝල්ඩ්මන්, ජේපී මෝගන් චේස් හා මෝගන් ස්ටැන්ලි යන බැංකු තුන එකතුව ගත් කල, ඔවුන්ගේ සේවකයන්ට ගෙවන වන්දි මුදල් හේතුකොටගෙන බිලියන 20 ක පමන බදු සහන හිමිකරගනු ඇත. බැංකුකරුවන්ට වසර අවසානයේ හිමිවන වාසනාව, වෙනම ලිපියක් තුල ටයිම්ස් පත්‍රය ජනවාරි 1 දින වාර්තාකල පරිදි, ටාප් මුදලින් බිලියන 25 ක් අත්කරගත්, වත්කම් අතින් එක්සත් ජනපද බැංකු අතරින් හතරවන විශාලතම බැංකුව වන වෙල්ස් ෆාගෝ, සිය ප්‍රමුඛ විධායකයින් සිව්දෙනාට මිලියන 25 ක ප්‍රසාද දීමනාවක් ගෙවීමට සැලසුම් කර ඇත. මෙය සම්පූර්නයෙන්ම ගෙවනු ලබන්නේ මුදලින් නොව, කොටස් හිමිකම් මාරුකිරීමෙන් ය.

මුදලින් වෙනුවට කොටස් හිමිකම් පැවරීමෙන් ප්‍රසාද දීමනා ගෙවීමේදී වෙල්ස් ෆාගෝ අනුගමනය කරන්නේ, ගෝල්ඩ්මන් සැක්ස් ඇතුලු අනෙකුත් විශාල බැංකුවල ආදර්ශයයි. පරිපාලනයේ පෙලඹවීම යටතේ බැංකු, විවිධ කොටස් හිමිකම් පැවරීමෙන් විධායකයන්ගේ වන්දි වලින් විශාල කොටසක් ගෙවනු ලැබීමේ දී සැලකිල්ලට ගෙන ඇත්තේ, වැටුප් දීමනා කෙටිකාලීන වාසි වලට වඩා දිගු කාලීන වර්ධනයට ගැටගැසීම පිලිබඳව ය. ඒ අනුව ටයිම්ස් පත්‍රය පෙන්වා දෙන්නේ, "බැංකු ... මූල්‍ය අර්බුදයෙන් ගොඩඑමින් තිබෙන්නේ නම්, ඒවායේ කොටස් - හා විධායකයන්ගේ ගෙවීම් - ඉහල යා හැකි බවයි."

බැංකු ක්ෂේත්‍රය මත අව්‍යාජ ප්‍රතිසංස්කරන හෝ සීමා පැනවීමට කටයුතු නොකරන බවත්, වෝල් වීදියේ ප්‍රභූ පැලැන්තියෙහි ධනය රැකදීම සඳහා සීමාන්තිකව වියදම් කරන බවත් ආන්ඩුව පැහැදිලි කර තිබෙන තතු හමුවේ, මුදල්වලට වඩා කොටස් පැවරීමේ ප්‍රසාද දීමනා වඩාත් වාසිදායක බව විශ්වාස කිරීමට බැංකුකරුවන්ට සෑම හේතුවක්ම පවතී. වෝල් වීදිය ගලවා ගැනීමෙහිලා ආන්ඩුවේ නොසැලෙන කැපවීම, නත්තල ලඟාවෙද්දී ආන්ඩුවේ පාලනය යටතේ පවතින මූල්‍ය උකස්කරනයේ දැවැන්තයන් වන ෆැනී මේ හා ෆ්‍රෙඩී මැක් යන ආයතන මත පනවා තිබුනු බිලියන 400 ආන්ඩුවේ ආධාර සීමාව ඉවත් කරන බව හා ඒවායේ ප්‍රධාන විධායකයන්ට මිලියන 6 බැගින් ගෙවීම සඳහා භාන්ඩාගාරයේ අනුමැතිය පලකිරීම මඟින් සලකුනු කොට තිබේ.

බැංකුවල ලාභ හා ප්‍රසාද ගෙවීම්වල තියුනු නැගීම, එක්සත් ජනපදයේ කොටස් වෙලඳපොලේ උන්මාදනීය එක්රොක්වීම සමග අත්වැල් බැඳගෙන ගමන් කරයි. මිලියන ගනන් රැකියා ස්ථිරව ම විනාශ වනු දැකිය හැකිවූ එම වසර තුල එක්සත් ජනපදයේ ප්‍රධාන කොටස් දර්ශක තුනෙහි ම වාර්තාගත නගීමක් ඇතිවිය. 2009 වසරෙහි ඩව් ජෝන්ස් කාර්මික දර්ශකය සියයට 18.8 න් ඉහල නැගුනි. වඩා පුලුල් ස්ටැන්ඩඩ් ඇන්ඩ් පුවර්ස් 500 දර්ශකය සියයට 23.5 න් හා තාක්ෂනික නැස්ඩැක් දර්ශකය සියයට 43.9 න් ද ඉහල ගියේය.

මාර්තු මුල ඒවායේ පහල ම අගයේ සිට ගත්විට, කොටස් දර්ශක ඊටත් වඩා වේගවත් වර්ධනයක් අත් කර ගෙන තිබේ. ජනවාරි 1 දින වොෂින්ටන් පෝස්ට් පුවත්පතට අනුව එය, "බොහෝ අයෝජකයන් සිය ජීවිත කාලය තුල නොදුටු පරිමානයේ රැලිවීමකි." ඩව් සියයට 59 න් ද එස්ඇන්පී 500 සියයට 60 න් ද නැස්ඩැක් සියයට 79 න් ද ඉහල නැගුනි.

මාර්තු මාසයේ පහත ම අගයේ සිට බෑන්ක් ඔෆ් ඇමරිකා කොටස් අගය සිව් ගුනයකින් ඉහල ගියේය. සමස්තයක් ලෙස මූල්‍ය කොටස් අගය සියයට 15 න් වැඩි විය. මාර්තුවේ පහත ම අගයේ සිට ෆෝර්ඩ් සමාගමේ කොටස් අගය සියයට 532 න් ඉහල නැගුනි.

වෙලඳපොලේ පතුලෙහි සිට සමස්ත එක්සත් ජනපද කොටස් අගය ට්‍රිලියන 5.6 කින් වැඩිවූ අතර, එම වාසනාව ධනවත් ම ආයෝජකයන් වෙත අසමානුපාතිකව බෙදී ගියේය.

මූල්‍ය වෙලඳපොලෙහි ඇතිවූ මවිතකර රැලිවීමට ප්‍රධාන හේතුව වුයේ, මහා අවපාතයෙන් පසුව ඇතිවූ නරකම මූල්‍ය කඩාවැටීම හමුවේ අන්ඩුව කිසිදු බැරෑරුම් ප්‍රතිසංස්කරනයක් සිදුකිරීම ප්‍රතික්ෂේප කිරීමයි. වර්ෂාවසාන සමාලෝචනය ඉදිරිපත් කරමින්

ජනවාරි 4 දින *වෝල් ස්ට්‍රීට් ජර්නලය* සඳහන් කලේ, "ලේමන් බ්‍රදර්ස්, ඇමරිකන් ඉන්ටනැෂනල් ගෲප්, ෆැනී මේ, ෆ්‍රෙඩී මැක්, හා වොෂින්ටන් මියුචුවල් බිඳ වැටීමෙන් හෝ ආන්ඩුව විසින් ගලවා ගැනීමෙන් වසරකට වැඩි කලක් ගතවූ තැන, මූල්‍ය වෙලඳපොලවල් සිහිමූර්ඡාවට පත්විය. වෝල් වීදිය වෙනස් වී ඇත්තේ කෙතරම් අල්ප ලෙස ද යන්න කැපී පෙනෙයි." යනුවෙනි.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ හිටපු ප්‍රධාන අර්ථශාස්ත්‍රඥ සිමොන් ජොන්සන් විසින් මූල්‍ය අර්බුදය පිලිබඳව මෑතක දී පලවූ ග්‍රන්ථ පිලිබඳව සමාලෝචනයක් කරමින් ආන්ඩුවේ ඇපදීමෙහි පරිමාව හා ස්වභාවය ඊට ගැලපෙන පරිදි සාරාංශගත කලේය. දෙසැම්බර් 27 දින *වොෂින්ටන් පෝස්ට්* හි ලිපියක් පලකරමින් ඔහු මෙසේ පැවසීය. "වෝල් වීදියේ විධායකයෝ සිය රැකියා, ප්‍රසාද දීමනා හා ඔවුන්ගේ විශ්‍රාම දීමනා රැකගත්හ. පාලනයේ පෙර නොවූ විරූ වෙනස්කම් වලින් ඔවුහු සහන සලසා ගත්හ. සීමාන්තික මූල්‍යමය හා රාජ්‍ය මූල්‍ය සහයෝගය දිනාගත්හ. සමාජයේ ආර්ථික නිරෝගීභාවයට වඩාත් අන්තරායකාරී ලෙස ඔවුන්ගේ ආයතන තව තවත් විශාල විය....

"අපගේ විශාලතම බැංකුවල විධායකයෝ, තවමත් ඔවුන්ට මුලුමනින්ම අවබෝධකරගත නොහැකි අසාමාන්‍ය අවදානම් දරමින් තම ආයතන පොලවට සමතලා කලහ. එහෙත් මෙම පුද්ගලයන් එය දැකගත්තේ, පුදුම එලවන සුලු වාසිදායක කොන්දේසි මත ඔවුන් පුද්ගලිකව නොරැකුනේ නම්, ලෝක ආර්ථිකය ඇනහිටීමට ඉඩ තිබුනු පරිද්දෙනි."

බුෂ් හා රිපබ්ලිකානුන්ට නොදෙවෙනි ආකාරයකින් ඔබාමා පරිපාලනය හා ඩිමොක්‍රටිකයන්, මෙම විධායකයන් හා ඔවුන් නියෝජනය කරන මූල්‍ය කතිපයාධිකාරයේ පුද්ගලික වාසනාව ආරක්ෂා කිරීම සිය ප්‍රධාන දූත මෙහෙවර බවට එකඟත්වයට පැමින සිටියි.

© www.wsws.org